# පුරප්පාඩු

## තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

**(2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ව්‍යවස්ථාපිත)**

මෙම කොමිෂන් සභාවේ පුරප්පාඩුව පවතින පහත දැක්වෙන තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**භාෂා පරිවර්තක (සිංහල / දෙමළ / ඉංග්‍රීසි) - තනතුරු 02**

**සුදුසුකම් :** බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් දෙමළ භාෂාව හෝ ඉංග්‍රීසි භාෂාව හෝ විෂයක් ලෙස සමත්ව ලබා ගත් උපාධියක් තිබීම

සහ

උපාධිය සඳහා දෙමළ භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ උපාධිය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී දෙමළ භාෂාව හා සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

**වයස :** අවුරුදු **22** නොඅඩු හා **45** ට නොවැඩි විය යුතුය.

**වැටුප් ක්‍රමය :** MA 3 : රු. 32,200 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 5 x 750 - 54, 960

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| | | |
|---|---|---|
| 01. | අදාළ අමතර පළපුරුද්ද | ලකුණු 30 |
| 02. | අදාළ අමතර අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් | ලකුණු 30 |
| 03. | වෙනත් කුසලතා හා කාර්යය සාධනයන් | ලකුණු 15 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතා | ලකුණු 25 |
| | මුළු ලකුණු | 100 |

**පොදු කොන්දේසි**

01. රාජ්‍ය හෝ සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල / කොමිෂන් සභාවල සේවය කරන අය තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.
02. තෝරාගනු ලබන අය 1956 අංක 22 රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති යටතේ පනවා ඇති නීති රීති වලට යටත් වේ.
03. පත් කරනු ලබන දින සිට සේවක අර්ථ සාධක අරමුදලට කොමිෂන් සභාව මගින් 12% ක් හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා 3% දායක මුදලක් ගෙවනු ලැබේ.
04. පත්වීම්ලාභීන් සඳහා අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ වෛද්‍ය රක්ෂණ ආවරණය ලැබේ.
05. සියලු තනතුරු සඳහා රජය අනුමත දීමනා හිමි වේ.

අයදුම්කරුවන් සහතිකවල ඡායා පිටපත් සමග තමන් විසින් පිළියෙල කර ගන්නා ලද ජීව දත්ත අඩංගු අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් 2025.03.10 වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව,**
**කාමර අංක 203-204,**
**ගොඩනැගිලි අංක 02,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,**
**කොළඹ 07.**